**ගම්පහ මහා නගර සභාව,**
**ගම්පහ දිස්ත්‍රික්කය.**
---------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 ජූලි 22 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 නොවැම්බර් 19 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 දෙසැම්බර් 04 දිනද සභාවට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ගම්පහ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට ගබඩා භාණ්ඩ තොග නිකුත්කිරීම් රු.37,497,152 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශන වල රු.38,420,400 ක් ලෙස පෙන්වීම නිසා වියදම්රු.923,248 ක් වැඩියෙන් හා එම වටිනාකමින් ගබඩා තොග අඩුවෙන් පෙන්වා තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළයුතු වේ. | ගබඩා තොග නිකුත් කිරීම් මූලික උපලේඛනයේ අඩුවෙන් සටහන් වී තිබූ අතරජ් අනුව අදාල ගබඩා ලේඛන හා වාර්තාද නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සභාවේ සේවකයින් 39 දෙනෙකුගේ වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවියයුතුව තිබූ රු.174,261 ක මුදල ණයගැතියන් ලෙස පෙන්වා නොතිබුණි. | අයවිය යුතු ශේෂ ගිණුම්ගත කළයුතු වේ. | වැටුප් රහිත නිවාඩු අයවීම් හා අයවිය යුතු වැටුප් අවසන් ගිණුම් සඳහා ණයගැති ශේෂ ලෙස සටහන් නොවී තිබීම ද පිළිගනිමි. |
| (ඇ) | සේවක අර්ථසාධක අරමුදලට ගෙවියයුතු දායක මුදල් හා අධිභාර රු.3,884,328 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන වල රු.3,500,000 ක් ලෙස දැක්වීමෙන් රු.384,328 කින් ණයහිමියන් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළයුතු වේ. | ණයහිමි ලෙස වෙන් කිරීම රු.384,328 කින් අඩුවෙන් ඇති අතර 2020.01.01 ආරම්භක ශේෂ දෝෂ නිවැරදි කිරීම යටතේ නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නිශ්චිතව හඳුනා නොගත් පසුගිය වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයයන් 07 කට අදාලව ප්‍රතිපාදන ඉතිරිවීම් රු.67,403,003 ක් හා සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 136 ක ප්‍රතිපාදන ඉතිරිවීම් රු.253,588,643 ක් මූලා ප්‍රකාශනවල ණයහිමියන් ලෙස වෙන්කර තිබුණි. | නිශ්චිත ණයහිමි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළයුතු වේ. | පූර්ව වර්ෂවල ණයහිමි ප්‍රතිපාදන වෙන්කිරීම් සඳහා වූ කාර්යයන් ඉටු නොකිරීම හා ප්‍රමාදයන් ඇතිවීමත් මත ගිවිසගෙන ඇති හා යෝජිත ව්‍යාපෘති සඳහා වූ ප්‍රතිපාදන ඉතිරිවීම් 2019.12.31 දිනට ණයහිමි ශේෂ ලෙස වෙන්කිරීම් සිදුකරන ලදී. |
| (ඉ) | ඉකුත් වර්ෂවලට අදාල ව්‍යාපෘති 77 ක් වෙනුවෙන් ගෙවියයුතු රු.3,874,348 ක් සහ සමාලෝචිත වර්ෂයේදී පුස්තකාල පොත් මිලදීගැනීම වෙනුවෙන් ගෙවියයුතු රු.540,979 ක් ණය හිමියන් ලෙස ගිණුම්වල දක්වා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මිලදීගත් රු.1,996,484 ක් වටිනා පුස්තකාල පොත් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදි වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළයුතු වේ. | පුස්තකාල පොත් මිලදී ගැනීමට අදාල ණයහිමි වෙන් කිරීම් මගහැරී ගොස් තිබූ අතරරු.1,996,484 ක් වටිනා පුස්තකාල පොත් ස්ථාවර වත්කම් ලෙස හඳුනානොගැනීම මත සිදු වී ඇත. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී ගිවිසුම්ගත නොවූ හෙල බොජුන්හලක් ඉදිකිරීම හා යක්කල සාප්පු සංකීර්ණය ඉදිකිරීම යන ව්‍යාපෘති දෙක සඳහා ගිණුම්වල රු.131,938,000 ක් වෙන්කර තිබියදී නැවතත් විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ රු.135,431,465 ක් ණයහිමියන් ලෙස ගිණුම්ගතකර තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළයුතු වේ. | ණයහිමි ප්‍රතිපාදන නිවැරදි කිරීමට හා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (උ) | ස්ථාවර වත්කම් ගිණුමේ හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ආරම්භක ශේෂ වල වෙනස වූ රු.1,263,914 ක් හඳුනාගැනීමකින් තොරව සමුච්චිත අරමුදලට හරකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායක වීම හා ආධාරවලින් දායක වීමේ ගිණුම් අතර තුලනය නොවන ශේෂය රු. 1,263,914කි. එය ගලපන ලදී. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේදී ඉවත්කල රු.18,104 ක් වූ පුස්තකාල පොත්මූලා ප්‍රකාශනවල රු.181,014 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | පුස්තකාල පොත්වල ඉවත්කළ වටිනාකම රු. 18,014ක් වූ අතර, එය රු.181,014ක් ලෙස පිටපත් කිරීම හේතුවෙන් ගිණුම්දෝෂය ඇතිවී තිබේ. |
| (එ) | නගර සංවර්ධන ව්‍යාපෘතියේ කඩ කාමර සඳහා හිඟ කුලී දඩ මුදල් රු.971,910 ක් ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළයුතු වේ. | පෙත්සම් කාරක සභාවේ නිශ්චිත තීරණයක් ලැබෙන තුරු මෙම දඩමුදල් අයකිරීම් සම්බන්ධව වටිනාකම් ගිණුම්වල නොපෙන්වීය. මෙම කඩ කාමර සඳහා කඩහිමියන් මුදල් ගෙවීමට කටයුතු කිරීමේදී අදාල දඩ |

| | | | |
|---|---|---|---|
| | | | මුදල් අයකිරීම මුදල් පදනම යටතේ සිදු කරමි. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයට අදාල වරිපනම් අතිරේක හර වටිනාකම රු.679,493 ක් සමුච්චිත අරමුදලට බැරකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | දෝෂ නිවැරදි කිරීමක් ලෙස පූර්ව කාලපරිච්ඡේද වලට අනුශාංගික වන පරිදි සමුච්චිත අරමුදලට ගැලපීම් කර ගිණුම්වලට ගෙන ඇත. |
| (ඔ) | සමාලෝචිත වර්ෂය තුල මිලදීගෙන නොතිබූ රු.99,856 ක් වූ අයිතම 21 ක් ස්ථාවර වත්කම් යටතේ සහ රු.75,480 ක් වූ උපකරණ 02 ක් ලී බඩු හා සවිකිරීම් යටතේ ද ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ස්ථාවර වත්කම් ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඕ) | සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති සඳහා මිලදී ගන්නා ලද රු.419,300 ක් වූ අයිතම 12 ක් සහ රු.1,954,370 ක් වූ පරිභෝජන ද්‍රව්‍ය 34 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ස්ථාවර වත්කම් ගිණුම් නිවැරදි කිරීම සඳහා කටයුතු කරමි. |
| (ක) | 2019 ජූලි මාසයේදී වාහන අළුත්වැඩියා සඳහා මිලදීගත් රු.200,500 ක් වූ අයිතම 12 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | නිවැරදි කිරීම සඳහා කටයුතු කරමි. |
| (ග) | සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබූ Network System ලී බඩු සවිකිරීම් යටතේ රු.63,900 ක් ලෙස සහ වෙනත් ස්ථාවර වත්කම් යටතේ රු.166,100 ක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | නිවැරදි කිරීම සඳහා කටයුතු කරමි. |
| (ජ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන බිල්කිරීම් වලින් ලැබීම් රු.51,753,398 ක් වුවත් රු.32,630,345 ක් ලෙස ගිණුම් ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | නිවැරදි ශේෂ අනාවරණය කරගැනීමට කටයුතු කරමි. |
| (ට) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ලැබීම් රු.29,989,676 ක් ණයගැති ගිණුමට බැර කරනවා වෙනුවට ව්‍යාපෘති තැන්පතු ලෙස ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඩ) | පසුගිය වසරේ ගෙවියයුතු ශේෂ 4 ක එකතුව වූ රු.1,389,416 ක් ප්‍රවර්තන වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස ඉදිරියට ගෙන නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | පසුව පිළිතුරු ලබාදීමට කටයුතු කරමි. |
| (න) | 2015 වර්ෂයේදී සේවකයන් 54 දෙනෙකු වෙනුවෙන් ගෙවියයුතු සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායක මුදල් රු.432,313 ක් හා ඊට අදාල රු.216,150 ක අධිභාර ගාස්තුව ණයහිමි ලෙස ගිණුම් වල පෙන්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | නිවැරදිව ණයහිමි ගිණුම් යටතේ හා වියදම් ගිණුම් යටතේ පෙන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ත) | 2018 සැප්තැම්බර් 27 දින ගෙවන ලද රු.100,000 ක් වූ නිවාස කුලී අත්තිකාරම් ගිණුම් වල පෙන්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.3.2 **ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සිනමාහල් 4 කින් 2010 සිට ලැබියයුතු රු.5,463,439 ක් වූ විනෝද බදු ශේෂය තුල වර්ෂ 10 ට වැඩි රු.1,543,525 ක්ද, වර්ෂ 5-10 අතර රු.2,182,421 ක්ද,වර්ෂ 2-5 අතර රු.1,054,475 ක්ද විය. | ලැබියයුතු ශේෂ අයකරගැනීමට කටයුතු කළයුතු වේ. | හිඟ මුදල් අයකරගැනීම සම්බන්ධ අවසන් තීරණයක් ගෙන අදාල නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

1.3.3 **නොසැසඳුන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයයන් 05 කට අදාලව ගිණුම් හා උපලේඛන අතර රු.76,639,470 ක වෙනසක් විය. | ගිණුම් හා උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හිඟහිටි වරිපනම් ආරම්භක ශේෂය රු.1,602,671 ක්, වරිපනම් ඉදිරියට ලැබීම් ආරම්භක ශේෂය රු.1,047,068 ක් ප්‍රාග්ධන ප්‍රදාන ණගැතියෝ රු.40,811,186 ක් ගිණුම් වලින් ඉවත්කිරීම සහ සමුච්චිත අරමුදලට කරන ලද ගැලපීම් රු.57,752,346 ක් සම්බන්ධයෙන් විධිමත් අනුමැතීන්, ලේඛන හා උපලේඛන විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි. | අදාල ලේඛන යාවත්කාලීනව නඩත්තු කළයුතු වේ. | අදාල ලේඛන හා උපලේඛන පිළියෙල කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |

1.4 **අනුකූල නොවීම්**

1.4.1 **නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන වරිපනම් බදු හා තක්සේරු ආඥා පනතේ වගන්ති අංක 20 | වර්ෂ 5 කට වරක් වරිපනම් තක්සේරු කලයුතු වුවද මුළු දේපල ගණන 24,036 ක ප්‍රමාණයකින් සභාව විසින් වර්තමානයේ වරිපනම් අයකරනුයේ ප්‍රධාන කාර්යාලය 2011 වර්ෂයේ සහ යක්කල උප කාර්යාලය 2006 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙනය. | පනතේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළයුතු වේ. | වරිපනම් තක්සේරුව සිදුකරගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත්කර ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) 371 | රු.691,745 ක් වූ අත්තිකාරම් ශේෂ 02 ක් නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි. | කාර්යය නිමවූ වහාම අත්තිකාරම් පියවීමට කටයුතු කළයුතු වේ. | ලබාගත් අත්තිකාරම් කාර්යය නිමවූ වහාම පියවාගැනීමට කටයුතු කරමි. |
| | (ii) 396 (ඈ) | නිකුත්කර මාස 06 ඉක්මවන ලද රු.93,950 ක් වූ චෙක්පතක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | උපදෙස් පරිදි කටයුතු කරමි. |
| | (iii) 571 | වසර දෙක ඉක්මවූ රු.22,939,561 ක් වටිනා පොදු තැන්පත් ශේෂ 842 ක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | නියමිත කාලය ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ලේඛන යාවත්කාලීන කර ආදායමට ගැනීමට වන ශේෂ ආදායමට ගැනීමට කටයුතු කරමි. |

## 2. **මූල්‍ය සමාලෝචනය**

## 2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූවියදම රු.5,246,986 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.114,443,685 ක් විය.

## 2.2 **මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එකතු වටිනාකම රු.222,233 ක් වූ අගරු චෙක්පත් 05 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | අදාල පාර්ශවයන් දැනුවත් කර ඇති අතර නොගෙවන වටිනාකම් සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

## 2.3 **ආදායම් පරිපාලනය**

### 2.3.1 **ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2019 වර්ෂය** | | | | **2018 වර්ෂය** | | | |
| --- | --- | --- | --- | --- | --- | --- | --- | --- |
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල්කල ආදායම** | **රැස්කලමුදල** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල්කල ආදායම** | **රැස්කල ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 69,209,420 | 86,320,761 | 67,210,697 | 41,689,628 | 56,790,384 | 57,891,101 | 56,026,008 | 36,363,153 |
| කුලී | 39,205,893 | 32,969,470 | 23,846,305 | 3,504,382 | 4,186,282 | 4,086,824 | 4,284,538 | 3,438,447 |
| බලපත්‍ර ගාස්තු | 6,650,000 | 6,162,328 | 3,391,920 | 240,411 | 2,745,000 | 3,045,150 | 3,232,788 | 107,087 |
| වෙනත් ආදායම් | 110,559,070 | 81,439,177 | 103,687,456 | 133,521,814 | 185,288,525 | 169,377,380 | 262,862,452 | 102,864,318 |
| | 225,624,383 | 206,891,736 | 198,136,379 | 178,956,235 | 249,010,191 | 234,400,455 | 326,405,785 | 142,773,006 |

2.3.2 **ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පෙර වර්ෂයේ තත්‍යආදායම රු.මිලියන 326.4 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ තත්‍ය ආදායම රු.මිලියන 198.1 දක්වා රු.මිලියන 128.3 කින් අඩුවී තිබුණි. මෙම අඩුවීමට ප්‍රධාන හේතුව වී තිබුණේ වෙනත් ආදායම් රු.මිලියන 159.2 කින් අඩු වීමයි. | ආදායම් අයකරගැනීමට කාර්යක්ෂමව කටයුතු කළයුතු වේ. | මුද්දර ආදායම් නොලැබීම හා ප්‍රාග්ධන ප්‍රදානයන්ගේ ලැබීම්වල අඩුවද මේ සඳහා බලපෑ කරුණු වේ. |

2.3.3 **වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ හිඟ වරිපනම් ශේෂය තුල වසර 1-3 දක්වා රු.10,815,269 ක්, වසර 3-5 දක්වා රු.6,044,854 ක්, වසර 5-10 දක්වා රු.12,636,519 ක් සහ වසර 10 ට වැඩි රු.2,575,014 ක් පැවතුණි. | හිඟ වරිපනම් අයකරගැනීමකාර්යක්ෂම කළයුතු වේ. | සමස්ථ හිඟ වරිපනම් ශේෂය අයකිරීම සඳහා හා හිඟ ආදායම් අයකිරීමේ ප්‍රගතිය සමාලෝචනය හා අධීක්ෂණය කිරීම සඳහා විශේෂ ආදායම් අනු කමිටුවක් පත්කර ඇත. |

2.3.4 **ව්‍යාපාර බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර බදු හිඟ ශේෂය රු.376,090 ක් වූ අතර,ඒ තුල වර්ෂ 01 ට අඩු රු.157,309 ක්ද , වර්ෂ 2-3 අතර රු.196,481 ක් සහ වර්ෂ 3-5 අතර රු.22,300 ක්ද විය. | හිඟ ව්‍යාපාර බදු ශේෂ අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් යෙදියයුතු වේ. | ව්‍යාපාර බදු හිඟ ශේෂ අයකර ගැනීම සඳහා නොපමාව කටයුතු කරමි. |

2.3.5 **බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට බලපත්‍ර ගාස්තු හිඟ ශේෂය තුල වර්ෂ 01 ට අඩු රු.157,174 ක් සහ වර්ෂ 2-4 අතර රු.83,237 ක් විය. | හිඟ බලපත්‍ර ගාස්තු අයකරගතයුතු වේ. | හිඟ ශේෂ කඩිනමින් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනිමි. |

2.3.6 **වෙනත් ආදායම්**

(අ) **දුරකථන සම්ප්‍රේෂණ කුළුණු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සමීක්ෂණ වාර්තා අනුව දුරකථන කුළුණු 12 ක් හා එහි ස්ථාපිත දුරකථන සේවා ජාල 03 ක් විය. එයින් කුළුණු 06 ක වරිපනම් තක්සේරුකර නොතිබූ අතර තක්සේරු කරන ලද කුළුණු 4 ක් සඳහා 2019 වර්ෂය වෙනුවෙන් රු.88,866 ක වරිපනම් අයවී නොතිබුණි. | හිඟ ගාස්තු නොපමාව අයකරගතයුතු වේ. | 2019 වසර සඳහා වන හිඟ ගාස්තු අයකර ගැනීම සඳහා නොපමාව කටයුතු කරමි. |

(ආ) **වාහන නැවතුම් ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වාහන නැවතුම් ස්ථාන 5 කින් අයවියයුතු රු.1,641,426 ක් අයකරගැනීම කෙරෙහි කළමනාකරණයෙහි අවධානය යොමුව නොතිබුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | කඩිනමින් මේ සඳහා නෛතික ක්‍රියාමාර්ග ගෙන මෙම මුදල් අයකරගැනීම සඳහා කටයුතු කරමි. |

(ඇ) **තානායම් ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගම්පහ තානායමෙන් රු.3,453,276 ක හිඟ මුදලක් අයවීමට තිබුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | හිඟ ගාස්තු අයකරගැනීම සඳහා දැනුවත්කිරීම් හා අඛණ්ඩ පසුවිපරමක් සිදුකිරීමට කටයුතු කරමි. |

2.3.7 **මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2010 අංක 04 දරන බස්නාහිර පළාත් මුද්දර ගාස්තු පැවරීමේ ප්‍රඥප්තියේ 2 වන වගන්තිය අනුව වසර 03 ඉක්මවා ඇති බැවින් 2015 සහ 2016 වර්ෂ සඳහා ලැබිය යුතු රු.2,139,880 ක මුද්දර ගාස්තු ආදායම අහිමිවී තිබුණි. | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කර මුද්දර ආදායම් ලබා ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් අදාල මුද්දර ගාස්තු සම්බන්ධ උපලේඛන නිකුත් කිරීමේ ප්‍රමාදයක් හේතුවෙන් කාලාවරෝධය යටතේ බස්නාහිර පළාත් සභාවෙන් මෙම මුද්දර ගාස්තු ගෙවීම් නොකරන ලදී. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

3.1 **කාර්ය සාධනය**

-----------------

මහානගරසභා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය සහ සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිලිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහ නගර සභා ආඥා පනතේ 272 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 39 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, 2019 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 34 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.ප්‍රචාරක දැන්වීම් පලකිරීම විධිමත් කිරීම හා ගාස්තු අය කිරීම , වාහන නවතා තබන ස්ථාන විධිමත් කිරිම, ආදාහනාගාර පිළිබඳ ගාස්තු අයකිරීම, සේවා ගාස්තු අය කිරීම හා දුරකථන කුළුණු ඉදිකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා 05 මෙතෙක් පනවාගෙන නොතිබුණි. | අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවා ගතයුතු වේ. | ඉදිරියේදී කටයුතු කරමි. |

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණු නමුත් ඒ ඒ අංශවලින් වර්ෂය තුළ ඉටුකර ගැනීමට බලාපොරොත්තු වූ උප අරමුණු වලින් සෞඛ්‍ය අංශයෙන් 07 ක්, ඉංජිනේරු අංශයෙන් 06 ක්, නීති අංශයෙන් 02 ක් පශු වෛද්‍ය අංශයෙන් 07 ක් හා අභ්‍යන්තර විගණන අංශයේ විගණන කටයුතු වර්ෂය තුලදී ඉටුකරගැනීමට නොහැකිවී තිබුණි. | ක්‍රියාකාරී සැලසුමට අනුව අදාල අරමුණු ඉටුකරගැනීමටකටයුතු කළයුතු වේ. | ඉදිරියේදී අරමුණු ඉටුකිරීමටකටයුතු කරමි. |

(ඇ) **ප්‍රතිපාදන නොසැලසීම**

------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික සැලැස්ම අනුව ඇස්තමේන්තුගත අගය රුපියල් මිලියන 21.2 ක මිනුවන්ගොඩ | අපේක්ෂිත සැලසුම් | මෙම ව්‍යාපෘති යෝජනා සකස් කර විධිමත් |

| | | |
|---|---|---|
| පාර රාත්‍රී අලෙවිසැල හා යක්කල බහුකාර්යය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන නොසැලසීම නිසා ඉටුකළ නොහැකිවී තිබුණි. | නිවැරදිව හඳුනාගෙන අයවැය මගින් ප්‍රතිපාදන සලසා ගතයුතු වේ. | අනුමැතියක් ලබා නොගැනීම මත අයවැය ලේඛන සඳහා ඇතුලත් වී නොතිබුණි. |

(ඇ) **අපේක්ෂිත කාර්යයන් ඉටු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයේ අයවැය ලේඛනයේ ප්‍රජාමණ්ඩල සඳහා ආධාර ලබාදීමට රු.මිලියන දෙකක් වෙන්කර තිබුණත් එම මුදලෙන් මිලදී ගන්නා හෝ ලබාදෙන ආධාර පිළිබඳව සැලැස්මක් සකස්කර නොතිබූ අතර මේ යටතේ දහම් පාසල් දියුණු කිරීම පරමාර්ථක් ලෙස දක්වා තිබුණද ඒ සඳහා කිසිදු කර්තව්‍යයක් සිදුකර නොතිබුණි. තවද ප්‍රජාමණ්ඩල සඳහා ඉකුත් වර්ෂවලදී ලබාදුන් උපකරණ පිළිබඳව පසුවිපරමක් මහා නගරසභාව විසින් සිදුකර නොතිබුණි. | ඉටුකිරීමට අපේක්ෂිත කර්තව්‍යයන් වර්ෂය තුල නිමකළයුතු වේ. | අපේක්ෂිත ආදායම් ලැබේ යන උපකල්පනය මත අයවැය ලේඛනයට ඇතුලත් කළ නමුත් එම ආදායම් නොලැබීම නිසා මෙය ඉටුකිරීමට නොහැකි විය. |

(ඉ) **කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට අවසන් කළයුතුව තිබූ රු.2,048,000 ක් වූ නගර සභා පරිශ්‍රයේ හෙල බොජුන්හලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ඉටුකර නොතිබුණි. | ඉටුකිරීමට අපේක්ෂිත ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන සලසාගෙන ඒවා වර්ෂය තුල නිමකිරීමට කටයුතු කළයුතු වේ. | 2019 වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවිය. |

(ඊ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | රජයේ ප්‍රසම්පාදන කාර්ය පටිපාටියෙන් බැහැරව 2019 අගෝස්තු 08 දින සිට කසළ බැහැර කිරීමට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන තිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9(ආ) ඡේදය ප්‍රකාරව සේවා ගිවිසුමක් අත්සන්කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන කාර්යය පටිපාටියට අනුව කටයුතු කළයුතු වේ. | පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් අනුව සහා තීරණයක් ගෙන පෞද්ගලික ඉඩමකට කසළ බැහැර කරයි. |

| | | | |
|---|---|---|---|
| (ii) | කසළ බැහැර කිරීමේදී මිණුම්ගත ක්‍රමයක් භාවිතාකර නොතිබූ අතර ලෝඩ් එකකට රු.30,000 ක් යනුවෙන් එකඟතාවයකට අනුව ගෙවීම්කර තිබුණි. | නිවැරදි මිනුම්ගත ක්‍රම භාවිතා කළයුතු වේ. | දැනට මිනුම්ගත ක්‍රමයක් සිදු නොවන අතර මිනුම්ගතකොට කසළ ලබා ගන්නා ආයතනයක් වෙත යොමු කිරීමට නිර්දේශකර ඇත. |
| (iii) | කසළ බැහැරකරන ස්ථානය පිළිබඳව 2020 සැප්තැම්බර් 07 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවට අනුව පරිසරයට හා සෞඛ්‍යයට හානි වන අයුරින් කසළ කඳු ගොඩගසා තිබුණි. | පරිසරයට හා සෞඛ්‍යයට හානි නොවන පරිදි කසළ බැහැරකිරීම සිදුකළයුතු වේ. | මේ සම්බන්ධව මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් උපදෙස් දෙන ලදී. |
| (iv) | කසළ බැහැරකරන ස්ථානයට පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. කසළ දමන ස්ථානයේ සෞඛ්‍යාරක්ෂිත බව පිළිබඳව සුපරික්ෂාකාරී වන ලෙසත් හා ඒ පිළිබඳ වාර්තා කරන ලෙසත් ගම්පහ මහාධිකරණය විසින් සභාවේ සෞඛ්‍ය පරීක්ෂකවරයාට නියෝගයක් ලබාදී තිබියදී ඒ පිළිබඳ සභාව කටයුතුකර නොතිබුණි. | නීති උපදෙස් හා නියෝග අනුව කටයුතු කළයුතු වේ. | අදාල පරිසර බලපත්‍ර ලබාගන්නා ලෙස උපදෙස් දෙන ලදී. |

(උ) **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කිරීම සඳහා ඉලක්ක 12 ක් සභාව විසින් සැලසුම්කර තිබුණි. ඒ ඉලක්ක යටතේ ක්‍රියාකාරකම් 48 ක් ඉටුකරගැනීම සඳහා සැලසුම්කර තිබුණත්ඉන් ඉටුකර තිබුණේ ක්‍රියාකාරකම් 18 ක් පමණි. | සැලසුම්කළ ක්‍රියාකාරකම් වර්ෂය තුලදී ඉටුකර ගතයුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(i) **ඉටුනොවූ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජංගම වෙළඳසැල් ප්‍රවර්ධනය, කාන්තා ආර්ථිකය දිරිගැන්වීම සඳහා කෝමාරිකා පැළ වගාව හා යක්කල - ගම්පහ නගරවල ගැමි ආහාර නිෂ්පාදන අලෙවිකිරීමට වෙළඳපොලක් ඇතිකිරීම යන ක්‍රියාකාරකම් තුන 2019 වර්ෂයේ සැලසුම්කර තිබුණද අයවැයෙන් ප්‍රතිපාදන | ඉටුකිරීමට අපේක්ෂිත සැලසුම් සඳහා අයවැයෙන් ප්‍රතිපාදන සලසාගතයුතු | අත්‍යවශ්‍යතාවය මත සැලසුම් නොකළ ව්‍යාපෘති ඉටුකිරීමට සිදුවූ අතර සැලසුම් කළ සමහර ව්‍යාපෘති ඉටුකළ නොහැකි විය. |

| | | |
|---|---|---|
| සලසා නොතිබුණු අතර 2019 අයවැය මගින් රු.30,000 ක ප්‍රතිපාදන සලසාගත් සූපශාස්ත්‍ර වැඩමුළුවද, රු.3,700,000 ක ප්‍රතිපාදන සලසාගත් ජනාවාස නාගරීකරණය හා සභාව සතු ක්‍රීඩාපිටි නිසි පරිදි නඩත්තුවද සිදුකර නොතිබුණි. | අතර ඒවා ඉටුකිරීමට කටයුතු කළයුතු වේ. | |

(ii) **අපේක්ෂිත ප්‍රතිලාභ ලබානොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගම්පහ රෝහල් සංකීර්ණය අසල රු.2,000,000 ක මුදලක් වැයකරමින් පොදුවැසිකිළි පද්ධතියක් ඉදිකර මාස 10 ක් ඉක්මගොස් තිබුණද මෙම වැසිකිළි පද්ධතිය මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා විවෘතකර නොතිබුණි. | ඉදිකිරීම් ව්‍යාපෘති වලින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගතයුතු වේ. | ඉදිරියේදී අදාල යටිතල පහසුකම් යටතේ සංවර්ධන හා නඩත්තු කටයුතු සිදුකරමි. |

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නගර සංවර්ධන ව්‍යාපෘතියේ කඩ කාමර 17 කින් රු.3,191,756 ක්ද, උක්ත ව්‍යාපෘතියට අයත් අනෙකුත් කඩ කාමර 48 කින් රු.10,596,383 ක්ද වශයෙන් රු.13,788,139 ක් හිඟව පැවති අතර ලැබියයුතු ආදායම් රැස්කර ගැනීම පිළිබඳව සභාවේ ක්‍රියාකාරීත්වය ඉතා දුර්වල මට්ටමක තිබුණි. | ලැබියයුතු ආදායම් කඩිනමින් රැස්කර ගතයුතු වේ. | දැනට මේ සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කර සියළු තොරතුරු සම්පූර්ණ කරගනිමින් ගිවිසුම් ඇති කඩ හිමියන්ගේ හිඟ ගාස්තු අයකිරීම සම්බන්ධව ආදායම් අනු කමිටුව හරහා කටයුතු කරනු ලබයි. |
| (ආ) | සභාව විසින් කුලී පදනමට ලබාදී තිබූ විවිධ කඩ කාමර 150 ක් වෙනුවෙන් ගිවිසුම් අත්සන්කර නොතිබුණි. | කඩ කාමර බදු දීමේදී විධිමත් ගිවිසුමකට එළඹියයුතු වේ. | ගිවිසුම්ගත නොවූ කඩ කාමර බොහෝමයක් පෙර මුදල් නොගෙවීම මත හා පැවරුම් ගාස්තු නොගෙවීම නිසා ගෙවීම් පැහැර හරිනු ලබන සියළු කඩ කාමර පවරාගෙන යලි ටෙන්ඩර් කිරීම සඳහා කටයුතු කිරීමට දැනට තීරණය වී ඇත. |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට මහා නගර සභාව සතු මාර්ග ප්‍රමාණය කි.මී. 2249 ක් වුවද ඒවා ගැසට් කර පවරාගැනීමට කටයුතුකර නොතිබූ අතර පිඹුරුපත්ද සකස්කරගෙන නොතිබුණි. | මාර්ග වල පිඹුරුපත් සකස්කර කඩිනමින් | මාර්ග ගැසට් කිරීමට පිඹුරුපත් අවශ්‍ය බැවින් මාර්ගවල පිඹුරුපත් මිනින්දෝරු |

| | | | |
|---|---|---|---|
| | | ගැසට්කිරීමට කටයුතු කළයුතු වේ. | දෙපාර්තමේන්තුව මගින් ලබාගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) | මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ බෙදාහැරීම සඳහා 2019 ජනවාරි 21 දින මිලදීගෙන තිබූ වටිනාකම රු.99,320 ක් වූ උදළුතල 104 ක් 2020 ජුනි 06 දින වන විටත් බෙදාහැරීමට කටයුතුකර නොතිබුණි. | සැලසුම් අනුව කඩිනමින් අදාල උදළුතල බෙදාහැරිය යුතු වේ. | ඉතිරි උදළුතල සභාවේ අවශ්‍යතාවය හා වෙනත් අවශ්‍යතාවයන් සලකා බලා ඉදිරියේදී බෙදාදීමට කටයුතු කරමි. |
| (ඉ) | ගම්පහ මහා නගර සභාව සතුව පොදු පහසුකම් ඉඩම් 99 ක් පැවති අතර, ඉන් ඉඩම් 60 ක් සඳහා ඔප්පු ලබාගෙන නොතිබුණි. ඉඩම් 19 ක් සඳහා ප්‍රකාශන ඔප්පු පැවති අතර, ඉඩම් 03 ක් සඳහා දිසාපතිගේ පැවරුම් ලිපි තිබුණි. තවද සභාව සතු පොදුඉඩම්වල ඇති සුසානභූමි වල්බිහිවී වැට මායිම් හා නාම පුවරු නොමැතිව අනාරක්ෂිතව පැවතුණි. | පොදු ඉඩම් වල ඔප්පු ලබාගැනීමට හා වැට මායිම් සකස්කිරීමට කටයුතු කළයුතු වේ. | සභාව සතු පොදු ඉඩම් වල ඔප්පු ලබාගැනීමට විශේෂ කමිටුවක් මගින් සිදුකරමින් පවතී. අදාල ඉඩම් හා සුසානභූමි වල වැට මායිම් සකස්කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| (ඊ) | ප්‍රජා මණ්ඩල වෙත බෙදාහැරීම සඳහා 2019 ජුනි 17 දින රු.798,750 කට ඇඳි සහිත ප්ලාස්ටික් පුටු 750 ක් හා 2019 අගෝස්තු 15 දින රු.1,125,000 කට 10’X20’කැනපි හට් 20 ක් ද මිලදී ගෙන තිබුණද, 2019 සැප්තැම්බර් වනවිටත් බෙදාහැරීමකින් තොරව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලෙහි ගොඩගසා තිබුණි. | කඩිනමින් බෙදාහැරීමට කටයුතු කළයුතු වේ. | ප්‍රජාමණ්ඩල වෙත බෙදාහැරීම මැතිවරණය නිසා සිදුනොකළ අතර ඉදිරියේදී බෙදාහැරීමට කටයුතු කරමි. |

3.3 **මානව සම්පත් කළමනාකරණය**

(අ) **තනතුරු පුරප්පාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 මැයි 19 දින සිට නාගරික ලේකම් තනතුරද, 2015 සහ 2019 වර්ෂවල සිට ආදායම් පරීක්ෂක තනතුරු 04 ක්ද පුරප්පාඩුව තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී පුරප්පාඩු පිරවීමට පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. |
| (ii) | පුරප්පාඩුව පවතින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත දෙපාර්තමේන්තුගත ප්‍රාථමික පුරප්පාඩු 49 ක් සඳහා විධිමත් බඳවාගැනීමකින් තොරව සේවකයින් 104 දෙනෙකු ව්‍යාපෘති පදනම මත බඳවාගෙන 2019 දෙසැම්බර් 31 දින වන විට රු.26,511,440 ක මුදලක් සහා අරමුදලින් ගෙවා තිබුණි. | ව්‍යාපෘති සේවකයන් බඳවාගැනීමේදී අදාල අනුමැතිය ලබාගතයුතු වේ. | සේවයේ අවශ්‍යතාවය මත සහා අනුමැතිය ලබාගෙන ව්‍යාපෘති පදනම මත සේවකයන් යොදවාගෙන ඇත. |

(ආ) **වැටුප් රහිත නිවාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවකයින් 39 දෙනෙකු සමාලෝචිත වර්ෂයේ වැටුප් රහිත නිවාඩු දින 1177 ½ ක් ලබාගෙන තිබුණි. | අදාල නීති රීති ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී මෙම සේවකයන්ගේ වැටුප් වර්ධක ලබා නොදෙන බව දන්වමි. |

(ඇ) **සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 10 ට වැඩි කාලයක සිට පැවත එන විශ්‍රාමික 34 දෙනෙකුගෙන් රු.264,105 ක ණය ශේෂයක්ද, ස්ථාන මාරු ලබා ගිය 06 දෙනෙකුගෙන් රු.7,450 ක ණය ශේෂයක්ද, ලංකා විදුලිබල මණ්ඩලයේ සේවයට අනුයුක්තවූ 07 දෙනෙකුගෙන් රු.35,170 ක ණය ශේෂයක්ද ලෙස රු.308,784 ක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | ණය ශේෂ අයකරගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී අයකරගැනීමට කටයුතු සැලසුම්කර ඇත. |

(ඈ) **සේවක ඇප**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2004 ජූලි 09 දිනැති අංක එල්පී/05/2004 දරන පළාත් පාලන කොමසාරිස්ගේ (බ.ප) සේවක ඇප මුදල් ලබාගැනීමේ චක්‍රලේඛය ප්‍රකාර සේවක ඇප තැබියයුතු නිලධාරීන් 34 කගෙන් ඇප ලබාගෙන නොතිබූ අතර 12 දෙනෙකුගෙන් පමණක් ඇප ලබාගෙන තිබුණි. එලෙස ලබාගත් සේවක ඇප තැන්පතු රු.21,705 ක් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. | අදාල චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු අතර අදාල ඇප තැන්පත් ශේෂයන් ගිණුම්වල දැක්වියයුතු වේ. | සේවක ඇප මුදල් තබා නැති නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබාගැනීමට හා ලබාගෙන ඇති ඇප මුදල් ගිණුම්වල දැක්වීමට ඉදිරියේදී කටයුතු කරමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 ලේඛනගත නොකළ වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහා නගර සභාව සතු කම්පැක්ටර් රථයක්, ට්‍රැක්ටර් රථ 02 ක් හා බැකෝ යන්ත්‍රයක් ලේඛනගතකර නොතිබුණි. | අදාල වත්කම් ලේඛනගත කළයුතු වේ. | ලේඛනගත කිරීමට කටයුතු කරමි. |

### 3.4.2 වත්කම් වලින් ලැබියයුතු ආදායම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභාවේ සේවයේ නියුතු කම්කරුවන් සඳහා 1982 වර්ෂයේ සිට ලබාදී ඇති නිල නිවාස තුනකින් 2019 දෙසැම්බර් 31 දිනට රු.63,149 ක් හිඟව පැවතියද මෙම හිඟය අයකර ගැනිම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. තවද නිල නිවාස 03 ක සභාවේ සේවකයින් නොවන බාහිර පාර්ශවයන් පදිංචිව සිටින බව නිරීක්ෂණය විය. | වත්කම් වලින් ලැබියයුතු ආදායම් කඩිනමින් අයකර ගතයුතු වේ. | දැනට හිඟව ඇති නිල නිවාස වලින් හිඟ කුලී අයකර ගැනීමේ හැකියාවක් ඇති නිවාස වලින් සේවක වැටුපෙන් හා විශ්‍රාම පාරිතෝෂික වලින් අයකර ගැනීම සඳහා කටයුතු කරනු ලබනඅතර අයකරගත නොහැකි වටිනාකමක් වේ නම් ඒ සඳහා නෛතික ක්‍රියාමාර්ග ගෙන අයකරගැනීම සඳහා කටයුතු කරමි. |

### 3.4.3 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත්පාලන අමාත්‍යාංශයෙන් 2015 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබූ වාහන 03 ක් පවරාගැනීමට කටයුතුකර නොතිබුණි. | අදාල වත්කම් පවරාගැනීමට කටයුතු කළයුතු වේ. | පවරාගැනීමට අදාල ලිපිලේඛන පළාත් පාලන අමාත්‍යාංශය වෙත යවා ඇත. |

### 3.4.4 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජීව වායු නිපදවීමේ ව්‍යාපෘතියෙන් වසර 14 ක සිට ගෙවල් 06 කට හා ව්‍යාපාරික ස්ථානයකට ජීව වායුව ලබාදී තිබුණද, 2019 වර්ෂය තුලදී නගර සභාවේ ආපන ශාලාවට පමණක් ජීව වායුව ලබාදී රු.22,000 ක ආදායමක් උපයාගෙන තිබුණි. ඒ අනුව මෙම ජීව වායු ව්‍යාපෘතිය ඌණ උපයෝජිතව පැවතුණි. | ජීවවායු ඒකකයෙන් උපරිම ප්‍රයෝජන ලබාගතයුතු වේ. | මිල අඩුකර ලබාදෙන ලෙස නිවැසියන් ඉල්ලුම්කර ඇතත් එයට සභාව එකඟනොවූ අතර දැනට ආපනශාලාවටද එම ජීව වායුව අනවශ්‍ය බව පවසා ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දින වනවිට විවිධ ස්ථාන වල පැවති කඩකාමර 32 ක් නිෂ්ක්‍රියව පැවතුණි. | අදාල පහසුකම් ලබාදී නැවත ටෙන්ඩර් කර යලි බදුදීමට කටයුතු කළයුතු වේ. | අදාල පහසුකම් ලබාදීමට නොහැකිවීම මත ටෙන්ඩර්ලබාදීමට අවශ්‍ය කටයුතු කළත් එය ලබානොගැනීම මත සිදුවී ඇත. |

3.5 **හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2005 සිට 2015 දක්වා සේවය කළ ව්‍යාපෘති සේවකයන් 18 දෙනෙකුට අදාලව සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10(1) හා 10(2) අනුව සේවකයින්ගෙන් හා සභාවෙන් අර්ථසාධක අරමුදලට ගෙවියයුතු දායකමුදල් පිළිවෙලින් රු.1,135,590 හා රු.1,703,386 ක් ගෙවීම පැහැරහැරීම හේතුවෙන් රු.1,419,487 ක අධිභාර මුදලක් ගෙවීමට සිදුවී තිබුණි. | සේවක අර්ථසාධක අරමුදල් පනත ප්‍රකාරව දායක මුදල් නියමිත දිනට ගෙවීමට කටයුතු කයුතු වේ. | අධිකරණයේ නඩු කටයුත්තක් සිදුවන බැවින් ඉදිරියේදී නඩු තීන්දුව ලද පසු ගෙවීමට සිදුවුවහොත් අදාල නිලධාරීන්ගෙන් අයකරගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සේවකයන් 54 දෙනෙකු වෙනුවෙන් 2015 වර්ෂය සඳහා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල් රු.432,313 ක් නොගෙවීම නිසා එම මුදල හා ඊට අදාල රු.216,150 ක අධිභාර ගාස්තුවක් ගෙවියයුතුව තිබුණි. | අදාල වර්ෂ වලදී නියමිත දින වල සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවීමට කටයුතු කළයුතු වේ. | අධිකරණයේ නඩු කටයුත්තක් සිදුවන බැවින් ඉදිරියේදී නඩු තීන්දුව ලද පසු ගෙවීමට සිදුවුවහොත් අදාල නිලධාරීන්ගෙන් අයකරගැනීමට කටයුතු කරමි. |

3.6 **අවිධිමත් ගණුදෙනු**

(අ) **නිවාස කුලී ගෙවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගණකාධිකාරීවරයා සඳහා නිල නිවාස හිමිකම් නොතිබියදී කුලී පදනම මත නිවසක් ලබාගෙන ඔහුට ලබාදී තිබුණි. මෙහිදී බාහිර පාර්ශවයකට රු.100,000 ක අත්තිකාරම් මුදලක් (තැන්පතුවක්) සහ මාසිකව රු.22,000 බැගින් රු.330,000 ක නිවාස කුලී මුදලක් 2018 ඔක්තෝබර් සිට 2019 දෙසැම්බර් දක්වා ගෙවීම්කර තිබුණි. තවද ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.2.1 වගන්තිය ප්‍රකාරව එම කාලසීමාව සඳහා රු.125,713 ක මුදලක් නිල නිවාස හිමිකම් නොමැති නිලධාරියෙකුගෙන් අයකර තිබූ අතර රු.204,287 ක වියදමක් සභාව විසින් ගෙවා තිබූ රු..100,000 ක අත්තිකාරම් මුදල සහා අනුමැතිය ලැබීමට පෙර ගෙවීම්කර තිබුණි. | නිල නිවාස හිමිකම් නොමැති නිලධාරීන් වෙනුවෙන් නිවාස කුලී ගෙවිය නොහැක. සභා අනුමැතිය යටතේ ගෙවීම් සිදුකළයුතු වේ. | නිල නිවාස කුලී වලට අතිරේක මුදලක්ද ලබාගෙන ඉතිරි මුදල සභා වියදමක් ලෙස සලකා එම පහසුකම ඔහුට ලබාදී ඇත. නගරාධිපතිවරයාගේ ආවරණ අනුමැතිය යටතේ හා සභාවේ අනුමැතියට යටත්ව ගෙවීම් සිදුකර ඇත. |

(ආ) **වාහන මිලදීගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 මාර්තු 17 දිනැති අංක 1/2016 ජාතික අයවැය චක්‍රලේඛයේ 2.2 වගන්තිය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය හා අනෙකුත් මාර්ගෝපදේශයන් දැඩිව අනුගමනය කළයුතු වුවද, මහා සභා තීරණයක් මත පමණක් පදනම්ව මෝටර් රථයක් 2019 අප්‍රේල් 12 දිනරු.4,315,575 කට මිලදීගෙන තිබුණි. | අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පූර්ව අනුමැතිය හා අනෙකුත් මාර්ගෝපදේශයන් දැඩිව අනුගමනය කළයුතු වේ. | සභාවේ තීරණය මත මිලදීගැනීම සිදුකරන ලදී. |

3.7 **මතභේදයට තුඩුදුන් ගණුදෙනු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 ජුනි 04 දින රු.199,980 කට මිලදී ගත් ප්ලාස්ටික් මල් පෝච්චි 6060 කින් 5000 ක් 2019 අගෝස්තු 30 දින ගොවි සංවිධානයකට ලබා දී ඉතිරි මල් පෝච්චි 1060 ගබඩාවේ රදවාගෙන තිබුණි. තවද ගොවි සංවිධානයේ නමින් ලබාගත් මල් පෝච්චි වලින් 3000 ක් මන්ත්‍රීවරයෙකුගේ නිවසක පැවති බව 2019 ඔක්තෝම්බර් 01 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | සැලසුම පරිදි කඩිනමින් අදාල බෙදාහැරීම් සිදුකළයුතු වේ. | මැතිවරණ කාලපරිච්ඡේදය නිසා බෙදාහැරීමට නොහැකි විය. එම බෙදාහැරීම් සිදුනොකළයුතු බවට චක්‍රලේඛයක් නිකුත්කර තිබුණි. |
| (ආ) | 2019 අප්‍රේල් 08 දින රු.149,250 කට මිලට ගත් පුටු 150 ක් 2019 අප්‍රේල් 08 දින ප්‍රජා මණ්ඩලයකට නිකුත් කල බවට ගබඩා ලේඛනයේ සටහන් වී තිබුණද එවන් සමිතියක් නොතිබූ අතර 2019 සැප්තැම්බර් 27 දින වනවිට එම පුටු මන්ත්‍රීවරයෙකුගේ නිවසේ රඳවා තිබුණි.තවද ප්‍රජා මණ්ඩල සඳහා උක්ත භාණ්ඩ ලබාදීම 2019 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත්කර නොතිබුණි. | අදාල ප්‍රජාමණ්ඩල වලට නිකුත්කළ බවට ගබඩා ලේඛන සටහන් කරන අවස්ථාවේදීම කඩිනමින්නිකුත් කළයුතු වේ. තවද ක්‍රියාකාරී සැලසුමටද ඇතුලත් කිරීමට කටයුතු කළයුතු වේ. | ප්‍රජා සංවර්ධන අංශය මගින් මෙවැන්නක් සිදුකර නොතිබුණි. |

3.8 **කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2020 ජූනි 25 දින වන විටත් ව්‍යාපෘති 24 ක වැඩ ආරම්භකර නොතිබූ අතර මෙම ව්‍යාපෘති සියල්ල ගිවිසුම් ගතවී තිබුණේ 2019 දෙසැම්බර් මාසයේය. | ව්‍යාපෘති වැඩ ආරම්භකිරීම කාර්යක්ෂම කළයුතු වේ. | මූල්‍යාමයසීමාව තුල එක් සමිතියක් ව්‍යාපෘති කීපයක් බැගින් ලබාගෙන තිබූ නිසා වැඩ ආරම්භ කිරීම ප්‍රමාද විය. තවද Covid -19 වසංගතයද මෙයට හේතු විය. |
| (ආ) | ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් මස ගිවිසුම්ගතව වැඩ ආරම්භකර තිබූ රු.23,487,120 ක් වටිනා වැඩ අවසන් නොකළ ව්‍යාපෘති 19 ක් 2020 ජූනි 25 දින වන විටත් ගිවිසුම් දීර්ඝකර නොතිබුණි. | ගිවිසුම්ගත ව්‍යාපෘති කඩිනමින් ඉටුකිරීමට කටයුතු කළයුතු වේ. | Covid -19 තත්ත්වය හමුවේ සභාවේ ක්‍රියාත්මක වූ සෞඛ්‍ය නීති රීති හා මූල්‍යාමය තත්ත්වය හේතුවෙන් වැඩ අවසන් කිරීමේ ප්‍රමාදය සිදුවිය. |
| (ඇ) | 2008 වර්ෂයේදී රු.122,655,339 ක ඇස්තමේන්තුගත අගයකට ආරම්භ කරන ලද යක්කල සාප්පු සංකීර්ණය වෙනුවෙන් අවසන් බිල්පත වූ රු.16,320,023 ක් 2018 හා 2019 වර්ෂ වල ගෙවීම්කර තිබූ නමුත් කළවැඩ පිළිබඳ ඉංජිනේරුවරයෙකුගේ සහතික නොතිබුණි. අවසන් බිල ගෙවීමේදී ඉදිකිරීම් හා කර්මාන්ත සංවර්ධන අධිකාරියේ නිර්දේශය මත ගෙවීම් කිරීමට සභාව තීරණයකර තිබුණද එය ක්‍රියාත්මකවී නොතිබුණි. මෙම ගෙවීම් සිදුකරන අවස්ථාවේදී රු.10,917,130 ක් වූ නිමි වැඩ වටිනාකමට මිල වැඩිවීම් ලෙස රු.5,402,892 ක් ද එකතුකර ගෙවීම් කර තිබුණි. ගෙවීම් ප්‍රමාදවීම හා නිසි අධීක්ෂණයක් නොමැතිවීම හේතුවෙන් මෙම මුදල වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි. | අදාල ව්‍යාපෘති වල මුදල් හා කාලය කළමනාකරණය කරගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතු වේ. | සභාවේ ඇතිවූ මුදල් අර්බුදය නිසා වරින්වර ව්‍යාපෘතිය නතරකිරීමට සිදුවිය. එනිසා කාලය දීර්ඝ කරන ලදී. මෙම කාලය තුල ඉදිකිරීම් ද්‍රව්‍ය මිල වැඩිවීම හේතුවෙන් මෙම මුදල ගෙවා ඇත. |